# පිපුණු මලේ රුව



**ශාකයේ පොදු නාමය :-** යෙලෝ ලැපචෝ, යෙලෝ ඉපේ, පාවු ඩාකෙරෝ ආමෙලෝ, ඉපේ ආමෙලෝ

**ශාක කුළය :-** බිග්නෝනියේසියේ (Bignoniaceae)

**උද්භිද විද්‍යාත්මක නාමය :-** *Tabebuia serratifolia*

**බහුලව ව්‍යාප්ත වී ඇති රටවල් :-** ප්‍රංශය, බොලීවියා, පැරගුවේ, උතුරු ආර්ජන්ටිනාව, මධ්‍යම හා දකුණු ඇමරිකාව

**සුදුසු දේශගුණය :-** නිවර්තන දේශගුණය

**ශාකයේ ස්වභාවය :-** මීටර් 37 ක් දක්වා උසකට වැඩෙන සාමාන්‍ය ගසකි.

**සාමාන්‍ය තොරතුරු :-** වියළි කාළගුණික තත්ත්වයට ඔරොත්තු දෙන ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වන අලංකාරය පිණිස වගා කරන ශාකයකි. හිරු එළිය ප්‍රිය කරයි. හොඳින් ජලය බැස යන මධ්‍යම ප්‍රමාණයේ ලවණ ගතියක් සහිත පසට රුචි බවක් දක්වයි. මෙම ශාකය අතු කැබලි හෝ බීජ මඟින් ව්‍යාප්ත කර ගත හැකිය. සංයුක්ත පත්‍ර තද කොළ පැහැති වන අතර පත්‍රිකා 5 කට බෙදී ඇත. කහ පැහැති පුෂ්පිකා රාශියක් පුෂ්ප මංජරියක හට ගනී. මල් හට ගැනීම උණුසුම් කාළගුණික තත්ත්වය යටතේ සිදු වෙයි. මල්වල ආවේණික සුවඳක් නොමැත. ඵලය දිගැටි පැළෙන සුළු ස්වෝටිකාවක් වන අතර පියාපත් සහිත බීජ රාශියකින් සමන්විත වේ. මෙහි දැවය තද ඝනකම් වන අතර සිල්පර කොට, නිවාස සෑදීම සහ පාලම් සෑදීම පිණිස යොදා ගනී.

පිපුණු මලේ රුව මෙවරත් ගෙනහැරු

ආචාර්ය ඒ.එම්.ඒ.එස්. අත්තනායක
නියෝජ්‍ය අධ්‍යක්‍ෂ

සුභාෂිණී සෙනවිරත්න
වැඩසටහන් සහකාර

*රාජකීය උද්භිද උද්‍යානය*
*පේරාදෙණිය*

